වෙබ් අඩවි නිර්මාණය

01 වෙබ් අඩවි නිර්මාණයේදී ඔබ භාවිතාකරන HTML උසුලනයන් පිළිබඳ හදුන්වන්න

Header උසුලනය

Font උසුලනය

Center උසුලනය

වගුව 5.1 - පාඨ හැඩගැන්වීම සඳහා භාවිත කළ හැකි උසුලන කීපයක්

HTML සලකුණ	අක්ෂර හැඩ ගැන්වීමේ ස්වභාවය	උදාහරණ
<b>	තද පැහැති (bold)	**SRI LANKA**
<i>	ඇද හැඩ (italic)	*SRI LANKA*
<u>	යටි ඉරක් සහිත (underline)	SRI LANKA
	අවධාරණය කරන ලද (emphasis)	**SRI LANKA**
<s>	අකුරු හරහා ඉරක් සහිත (strike out)	~~SRI LANKA~~
<sup>	උඩු ලකුණු කරන ලද (superscript)	SRI LANKA
<sub>	යටි ලකුණු කරන ලද (subscript)	SRI LANKA
<marquee>	තිරස් දිශාවට චලනයක් පෙන්වන (horizontally moving text)	(මෙය වෙබ් පිටුවකට යොදා පරීක්ෂා කර බලන්න)

ක්‍රියාකාරකම

පහත 5.18 වන රූපයේ දක්වා ඇති කේතයේ වූ පාසලේ නම වෙනුවට ඔබේ පාසලේ නම යොදා ඔබ කැමති වෙනස් හැඩ ගැන්වීම් සහිත ව වෙබ් පිටුවක් නිර්මාණය කරන්න. මෙහි දී ඔබ සිංහල යුනිකෝඩ් අකුරු ("iskoola pota") යොදා ගන්නේ නම් ලේඛනය තැන්පත් කිරීමේ දී 5.19 රූපයේ පරිදි Save As සංවාද කොටුවේ Encoding ස්වරූපය Unicode ලෙස සකස් කළ යුතු ය. ඔබේ වෙබ් පිටුවේ 5.20 රූපයේ වූ ප්‍රතිදානය සමග සසඳන්න.

```
<html>
        <head><title> Text Formatting </title></head>
<body>
        <font face = "iskoola pota" color = "Green" ><h1> 1. ඔබේ පාසලේ නම </h1></font>
        <font face = "iskoola pota" color = "lime" ><h2> 2. ඔබේ පාසලේ නම </h2></font>
        <font face = "iskoola pota" color = "olive" ><h3> 3. ඔබේ පාසලේ නම </h3></font>
        <font face = "iskoola pota" color = "Navy" ><h4> 4. ඔබේ පාසලේ නම </h4></font>
        <font face = "iskoola pota" color = "blue" ><h5> 5. ඔබේ පාසලේ නම </h5></font>
        <font face = "iskoola pota" color = "Aqua" ><h6> 6. ඔබේ පාසලේ නම </h6></font>
        <font face = "iskoola pota" color = "Teal" ><h6> 7. ඔබේ පාසලේ නම </h6></font>
</body>
</html>
```

රූපය 5.18 - HTML ලේඛනය